ඇඹිලි-බිලි කියන්නේ තදබල කම්පනයකින් උපන් නිර්මාණයක්

ලේඛිකා වත්සලා ගමගේ

"එතකොට මං..?
ඔයා පොළොව යට තිබුණු කාටත් මගෑරිච්ච මැණිකක් වගේ. අමාරුවෙන් කැණලා හොයාගත්තේ.
ආ..?
මා ප්‍රේමයෙන් උමතු වී යනු ඇත. රමණීය වලාරොදක මා පාව යන්නට ඔන්න මෙන්නය.
මටම ඕන මැණික ලැබුණා. මට නිල් මැණිකක් ලැබුණා. මා ප්‍රේම දිස්නය ඔහු මත පතිත වනු නිසැකය. මා තදාසන්න අන්ධකාරයෙන් පිරී ගොස්, මා ආශ්‍රිතව දීප්තිමත් වර්ණයක් ජනිත වේ. ප්‍රේමානන්දයෙන් මා මුසපත් වෙමින් යයි."
මේ වත්සලා ගමගේ ලියූ කුලුඳුල් නවතම නවකතාව වන ඇඹිලි - බිලි ප්‍රේම වෘත්තාන්තයේ උපුටනයකි. අපි ලේඛිකා වත්සලා ගමගේ දෙසට හැරෙමු.

● ඔබ කවුරුදැයි යන්නට දෙන පිළිතුර කුමක්ද ?

මගේ අම්මා මහනුවර නාවලපිටියේ. මගේ පියා ගම්පහ පස්යාලේ. 1970 ගණන්වලදි ඒ අය ඇඹිලිපිටියට සංක්‍රමණය වෙලා තියෙන්නේ, පියාගේ වෘත්තිය හේතුවෙන්. මම ඉපදුණේ 1981දී. මට වැඩිමල් අයියා කෙනෙකුයි, අක්කා කෙනෙකුයි ඉන්නවා. මම පවුලේ බාලයා. මගේ පාසල ඇඹිලිපිටිය මධ්‍ය මහා විද්‍යාලය. දැන් එය ජනාධිපති විද්‍යාලය. මම කලා අංශයෙන් උසස් පෙළ දක්වාම අධ්‍යාපනය හදාරලා 2001දී මම කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයට ඇතුළත් වෙනවා. 2004 දී විශ්වවිද්‍යාලයේ මාධ්‍ය අධ්‍යයනය පිළිබඳව විශේෂවේදී උපාධිය ගන්නවා. ඉන් පස්සේ මාධ්‍ය පිළිබඳ පුහුණුවට ලේක්හවුස් ආයතනයට ඇතුළත් වෙනවා. නමුත් මම දැන් ගුරුවරියක්. මාලබේ ආදර්ශ පිරිමි විද්‍යාලයේ ජන සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය උගන්වනවා.

● ඔබේ නවකතාවට ඇඹිලි - බිලි නම යෙදුවේ කුමන අරුතකින්ද ?

ඇඹිලි - බිලි යන්නට විශේෂ තේරුමක් නෑ. එය මගේ මුවගට නිරායාසයෙන්ම ආ වදනක්. නමුත් මෙයට විවිධාකාරයේ අර්ථ නිරූපණය කරන්න පුළුවන්. ඊට පළමු කාරණාව තමයි, මේ නවකතාවට මුල් වන්නේ ඇඹිලිපිටිය නගරයයි. අනෙක් කාරණාව බිලි කියන්නේ ඇඹිල්ලක්. ඒ වගේම නිරපරාද අනවශ්‍ය හිංසාවක් කියන්නත් පුළුවන්. මෙයින් විවරණය කරන්නේ සමාජමය හිංසනයක්. ඒ වගේම කායික සහ මානසික වශයෙන් සිදු වූ හිංසනයක්. නමුත්, ඇතැම් විට ඇතමුන් මෙය කියවා නොයෙක් අර්ථකථන කරන්නත් පුළුවන්. විවිධ දේශපාලන හා සමාජ චින්තකයන් තම තමන්ගේ, අදහස අත්දැකීම් අනුව විවිධාකාර විවරණ ඉදිරිපත් කරන්නත් පුළුවන්. නමුත් මේක මගේ ස්වයං නිර්මාණයක්. මේ නිර්මාණය සිදු වුණේ මගේ සිතුවිලි ගොන්න තුළයි. සමාජ සන්දර්භය තුළ සිදු වූ සදාතනික ගැටලුවක්, මෙය මගේ ස්වයං පරිකල්පනය සහ සත්‍ය අත්දැකීම් එක්ක ගොඩනැඟූ නිර්මාණයක්. ඒ නිසයි, රතත්ත්‍යමය විවරණයක ප්‍රබන්ධයර යනුවෙන් හඳුන්වලා තියෙන්නෙත්.



● මෙම නිර්මාණයට ඔබ සිදු කළ පර්යේෂණය කුමක්ද ?

ඉතා දිගු කාලයක් තුළ මා ඇසූ, දුටු සංසිද්ධි සහ අත්දැකීම් මගේ ඔළුවේ කැකෑරෙමින් තිබුණා. වසර විස්සක් වැනි කාලයක් තිස්සේ මං මේ ගැන සෙව්වා. ඒ වගේම ලියන්නත් පටන් ගත්තා. විවිධ සංශෝධන කළා. විශ්වවිද්‍යාලයෙන් පසුව සේවා වියුක්ති කාලය තුළ මම මෙය ලියන්න පටන් ගත්තා. ඒත් එක්කම මට තදබල තාක්ෂණික වුවමනාවක් තිබුණා ටයිප් කරන්න. මගේ සිතුවිලි කෙළින්ම අකුරු කරන්න මං පටන් ගත්තා. ඊට පස්සේ සම්පූර්ණයෙන්ම එය මැකිලා ගියා. එය මට මහත් කනගාටුවට කරුණක් වුණා. මම වැඩේ අත්හැර දැමුවා. ඒත් එක්කම මටත් තව තදබල කම්පනයක් සිදුවුණා. ඒ තමයි තාත්තාගේ මරණය. තාත්තාගේ මරණයෙන් සිදුවූ කම්පනයෙන් මම ආයෙත් ලියන්න පටන් ගත්තා. කතාව වෙනත් දිශාවකට ගලාගෙන ගියා. පැමිණි කොරෝනා වසංගතය මට ආශිර්වාදයක් වුණා. මේ කාලය තුළ මම මෙය ලියා නිම කළා. නැවත නැවත සංස්කරණය කළා. මගේ හිතට හරියි කියන තැනට එනකම් මම මේක වාර ගණනක් සංස්කරණය කළා. එළියට ඇවිත් බලනකොට ප්‍රකාශකයෙක් නෑ. රටේ පැවැති ආර්ථික ප්‍රශ්න සහ කඩදාසි ප්‍රශ්න නිසා එය තවත් ගැටලුවක් වුණා. පසුව ගොඩගේ ප්‍රකාශකයන් විසින් මේ ග්‍රන්ථය මට පළකොට දුන්නා.

● ඔබේ නවකතාවට වස්තු විෂය වුණේ කුමක්ද ?

ලෝකයේ සදාතනික දේශපාලන ගැටුම් හා අර්බුද තියෙනවා. ඒවා වෙනස් කරන්න බෑ. කෙසේ වෙතත් එයින් සිදුවන හිංසාව පිටු දැකිය යුතුයි. හිංසාවට වඩා ළතෙත් සෞම්‍ය ගති තියෙන (අන්තරාවර්තීය) තමන්ගේ සිත සමඟ ගනුදෙනු කරන මිනිසුන් අවශ්‍යයි. යොවුන් ප්‍රේමය බොළඳයි. ඒ වගේම පවිත්‍රයි. එය කුමන බාධක මැද්දේ වුණත් ගලාගෙන යනවා. බුදු දහමින් වගේම කිතු දහමෙන් ද ප්‍රේමය පිළිබඳව ඉස්මතු කළා. ආගම නිසා මිනිසුන්ගේ හිත නිවෙන හැටි, ප්‍රේමය වපුරන හැටි, ඉන් සැනසීමක් ගන්න පුළුවන් විදිහ මනෝ විද්‍යාත්මක ප්‍රවේශයකින් මම මෙහි කතා කරලා තියෙනවා. මිහිනි කියන චරිතය වටා මේ කතා වස්තුව දිව යනවා. මිහිනිගේ පාසැල් ප්‍රේමය, පාසල් මිතුරු කැල වගේම විශේෂ ගුරුවරයෙකුත් ඉන්නවා. ගුරුවරයා විප්ලවකාරී චරිතයක්. මේ චරිත කාලයත් සමඟ නොයෙක් හැල හැප්පිලිවලට භාජනය වෙනවා. අනාගතයේ මිහිනි පාසල් ගුරුවරියක් වෙනවා. ඇගේ සියලු ආදරණීයයන් අහිමි වුවත්, ඇය ශක්තිමත් ගැහැනියක් වශයෙන් සමාජයට මුහුණ දෙනවා.

ඒ වගේම මේ කෘතිය තුළ සාමාජයේ සත්‍ය සිදුවීම් කිහිපයකුත් ගොනු වෙනවා. උතුරු නැඟෙනහිර යුද්ධයේ බිහිසුණු බව, සමාජ සංස්කෘතික දේශපාලන පෙරළි, අසාධාරණකම්, මේ සියල්ල ඇතුළත්.

● ඔබේ ලියවිල්ලට ඔබ යෙදූ භාෂාමය උපත්‍රම මොනවාද ?

මම මෙයට උපමා රූපක රැසක් භාවිත කළා. මේක එක හුස්මකට කියවගෙන යෑමට වඩා සැනසිල්ලේ කියවිය යුතු ග්‍රන්ථයක්. ශ්‍රී ලංකාවේ මෑත කාලීන ගැටුම්කාරී සංසිද්ධි පිළිබඳ වඩාත් අවදියෙන් සිටින සහ ඊට රුචිකත්වයක් දක්වන අය මේ කෘතිය ඇගයීමට ලක් කළා.

● ඇඹිලි - බිලි නවකතාවේ ඔබේ භාෂා භාවිතය රළු බවට ඇතැම් පාඨකයන්ගෙන් චෝදනාවක් තියෙනවා. ඔබේ පිළිතුර කුමක්ද ?

මම සමාජයේ යම් යම් සංසිද්ධි ලෙස විචාරාත්මකව බැලීමට පුරුදු වූ කෙනෙක්. ඒ නිසා මගේ කථනය සෘජුයි. ඒ සෘජු බව මගේ ලේඛනයටත් ඇවිත් තියෙනවා. මා කුඩා කල පටන් ඇසුරු කළ සාහිත්‍යය සමඟ මෙය සමබර කරලා අලුත් චින්තන ධාරාවකට යා හැකි භාෂාවක් මම භාවිත කළා. ඒ නිසා ඇතැමුන්ට එය රළු විය හැකියි. ඒත්, ඒ කියන රළු බවට යටින් ඇති ලාස්‍ය චින්තනය අවබෝධ කරගත හැකියි. උදාහරණයක් විදිහට කෙනෙකුට ආදරය ප්‍රකාශ කරන්නට විවිධාකාර හඬ ස්වර භාවිත කරන්න පුළුවන්. ඒ නිසා මගේ භාෂාවත් එවැන්නක්.

● මෙය ඔබේ පළමු නිර්මාණය නම්, ඊළඟ නිර්මාණයන් කෙසේ වෙයිද ?

ඇඹිලි - බිලි කියන්නේ මගේ කුලුඳුල් නවකතාව. ඉදිරියේදී මම පර්යේෂණාත්මක නවකතාවක් ලියන්න සූදානමින් ඉන්නවා. ඇඹිලි - බිලිවලට ලැබෙන ප්‍රතිචාර මත එය ඉදිරියේදී සිදුවේවි. මම නව පරපුරත් එක්ක නිතර ගනුදෙනු කරන කෙනෙක් නිසා, මම ඒ අයගේ සිතුවිලි හොඳින් දන්නවා. ඔවුන්ගේ ඒ සිතුවිලි ධාරාවට ආමන්ත්‍රණය කරන්න මම උත්සාහ කරනවා. ඒ වගේම මගේ ඉදිරි නිර්මාණවලදී එය දැක ගත හැකි වේවි.

ශ්‍යාමා සමරසිංහ
ඡායාරූපය - විමල් කරුණාතිලක

ලිවිසැරිය
LIVISARIYA
පොත් පුවත්

මුද්‍රිත මාධ්‍ය අත්පොත

වර්තමානයේ ජනමාධ්‍ය විෂය සම්බන්ධයෙන් පවතින විශාල ඉල්ලුමත්, විවිධ ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන ජනමාධ්‍ය පාඨමාලාවල ප්‍රමිතිය පිළිබඳ යම් ගැටලු පවතින බැවිනුත්, පුද්ගලයන්ගේ වෘත්තීය දැනුම හා පසුබිම පිළිබඳ ගැටලු පවතින බැවිනුත්, මේ සඳහා විෂය සම්බන්ධයෙන් ප්‍රාමාණික දැනුමක් නොමැති වීම හා විෂයානුබද්ධ කෘති ප්‍රකාශයට පත්වීම සීමාසහිත වීම යන කරුණුවලට පිළිතුරක් ලෙස මෙම අත්පොත විසඳුමක් ලෙස එළි දක්වා ඇත. එබැවින් මෙම අත්පොත ආධුනික මාධ්‍යවේදීන්ට, ජනමාධ්‍ය විෂය හදාරන සරසවි හා පාසල් සිසුන්ට අත්වැලක් වෙනු ඇත. ජනමාධ්‍ය විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීණ ලේඛක මඩුල්ලක් විසින් මෙහි ලිපි සම්පාදනය කොට ඇත.

සංස්කරණය - දයා ලංකාපුර, ධම්මානන්ද විජේසිංහ, තිළිණ සමරසූරිය.
ප්‍රකාශනය - ශ්‍රී ලංකා කලා මණ්ඩලය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, බුද්ධශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.
මිල - රුපියල් 800/=

සිහින දූවිලි

විදේශිකයන්ගේ ආගමනය නිසාවෙන් ගරා වැටුණු දකුණේ සංස්කෘතියත්, ඒ නිසාවෙන්ම සිදුවුණු මිශ්‍ර ජාතික දරුවන්ගේ පැතිරීමත් හා යම් යම් සමාජ තලයන්හි සිදුවන මානසික පිරිහීම, ලිංගික අපචාර හා ගෘහස්ථ වධ හිංසාවට ලක්වන මුහුදුබඩ දරුවන්ගේ ඉරණම අන්තර්ගත කොට මෙය නවකතාවක් වශයෙන් ලියා පළ කොට ඇත.

කර්තෘ - තුෂාරි අබේසේකර
ප්‍රකාශනය - සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම
මිල - රුපියල් 650/=

ඔටු දෙනගේ කඳුළු බිඳු



දල්හධම්ම ජාතකය ඇසුරින් ලියැවුණු ළමා කතාවකි. රජ කෙනෙක් සහ ඔටුවෙක් අතර ගැටුනෙතුණු කතා පුවතක් මෙහි වස්තු විෂය කොටගෙන තිබේ. කළගුණ සැලකීම මෙහි උපදේශයයි. සෑම පිටුවකටම අතින් අඳින ලද ඉතා වර්ණවත් පින්තූර සහිතය. මෙහි පිටු ගණන අටකි.

කර්තෘ - අරියදාස මිල්ලගහතැන්න
ප්‍රකාශනය - සමයවර්ධන පුද්ගලික සමාගම
මිල - රුපියල් 125/=

අගාධ

සොබා දහම නොතකා හැල්මේ දිවහිය ලෝකය ද ආගාධයේ මුව විට මඳකට නවතා ගලවා ගන්නට පියවි දෑසින් දැකිය නොහැකි මාරාන්තික වෛරසයක් සමත් නොවේද ? පරිසරයට විෂ කටින මිනිසා මරණය ද විනාශය ද කැන්දාගෙන යන බව යළි යළිත් කිව යුතු නොවේ. මෙවන් වස්තු විෂයක් ඊඅගාධර නවකතාව සඳහා තේමාව වී ඇත.

කර්තෘ - ශාන්ති දිසානායක
ප්‍රකාශනය - සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම
මිල - රුපියල් 1000/=

ප්‍රශස්ත සමාජ මාධ්‍ය භාවිතයක් සඳහා වන මාර්ගෝපදේශ මාලාව

දැනට පවතින නීතිමය රාමුව, සමාජ සාරධර්ම වෘත්තීය ආචාර ධර්ම යන මේ සියලු සාධක සැලකිල්ලට ගනිමින් සමාජ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ හැසිරිය යුතු සහ එහිදී කළ යුතු සහ නොකළ යුතු දේ සඳහා වන මග පෙන්වීමක් ලෙස සමාජ මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් වන මේ මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දී ඇත.

ප්‍රකාශනය - මාධ්‍ය නීති සංසදයෙනි.

විචාර කවුළුව

බරසාර වෙනුවට තිරසර කතා කලාවක්

ප්‍රබන්ධයක් ගෙතීමේ ශිල්ප-ධර්ම මැනැවින් ගළපා ගන්නා කතුවරයා සරල සුන්දර නවකතාවක් අප හමුවේ තබයි. තර්කයක් ලෙස ගතහොත් නව කතාවේ අර්ථය වින්දනය බව කතුවරයා පිළිගෙන තිබේ. ඒ අනුව ඔහු ඉතා සූක්ෂ්ම ලෙස ශිල්ප - ධර්ම හසුරවමින් පාඨකයා අසීරුතාවකට පත් නොකොට අපූරු කතාවක් පාඨක සමාජය හමුවේ තබයි.

නවකතාව සම්බන්ධයෙන් අලුත් මතවාද, විවරණ, විග්‍රහ තිබිය යුතු බව සැබෑවකි. ප්‍රබන්ධ කතාවට අලුත් විලාස ඉදිරිපත් වීමෙන් එහි විෂය පථය පුළුල් වන බවද, පාඨක ආකර්ෂණය දිනා ගැනීමේ අවස්ථාව වැඩි වන බව ද පිළිගත යුතු කාරණයකි. අමෙරිකාවේ, ඉන්දියාවේ, අප්‍රිකාවේ සාහිත්‍යය තුළ මේ වෙනස සිදුවෙමින් පවතී. ඒ කුමන අත්හදා බැලීම් පැවැතිය ද 19 සියවසේ මුල් කාර්තුවේ පටන්ම නවකතාව සම්බන්ධයෙන් අඛණ්ඩව පවතින යථාර්ථයන් කිහිපයක් තිබේ.

I. **ප්‍රබන්ධයක කතා වස්තුව අංක එකට පැමිණිය යුතුය. එය විශ්වාසවන්ත හා අව්‍යාජ එකක් සේ පැවැතීම වැදගත්ය.**
II. **කුමන විලාසයෙන් නවකතාව නවීකරණයට ලක් කළ හැකි වුව ඊට කතාන්දරයෙන් බැහැර විය නොහැකිය.**
III. **භාෂාව හා ශෛලිය ප්‍රබන්ධයක වැදගත්ම සාධක දෙකක් වන අතර ඒවා නිර්මාණශීලී ලෙස හසුරුවා ගත නොහැකි නම්, අන්තර්ගතය කොතරම් බරසාර වුව නවකතාව සාර්ථක වන්නේ නැත.**

කතා වස්තුව යනු කුමක්ද? (Plot in the arrangement of event make up a story) කතා වස්තුව යනු ප්‍රධාන සිදුවීම් මනාව ගළපාගෙන සාර්ථක කතාවක් ගොඩනැඟීමය. ඒ සඳහා ප්‍රබල වෑයමක යෙදිය යුතු බව බොහෝ දෙනාගේ මතය වේ. කතා වස්තුව අවියෝජනීය ලෙස ගළපා ගතහොත් නවකතාවේ කටයුතුවලින් 50%ක් අවසන් බව ඇතැම් කතාකරුවන්ගේ මතය වෙයි. එය පිළිගත හැකි යථාර්ථයකි. දුර්වල කතා වස්තුවක් දිගේ ප්‍රබන්ධය විකාශය නොවේ. මෙහිදී සලකා බැලිය යුතු සාධක කිහිපයක් ඇත.

I. **අව්‍යාජත්වය**
II. **සිදුවීම් මනාව ගැළපීම**
III. **තර්කානුකූලභාවය**
IV. **අවුල්වලින් තොරව ගලා යන කතාවක් දකින්නට ලැබීම**

නූතන නවකතාවේ සාර්ථකත්වයට බලපා ඇති ප්‍රධාන සාධක තුනක් ඇතැයි සමහර විචාරකයෝ පෙන්වා දෙති.

I. **සාර්ථක කතා වස්තුව**
II. **භාවපූර්ණ භාෂාව හා ආකර්ෂණීය ශෛලිය**
III. **නැවුම් ඉදිරිපත් කිරීම**

ඉහත සඳහන් පූර්විකාව ලියා තබන්නේ තරමක් වෙනස් ආකාරයක සිංහල නවකතාවක් ගැන සංවාදයක් ගොඩනැඟීම සඳහාය. නවකතාව "දෙයියන්ගේ ඇතා" ලෙස හඳුන්වා ඇත. කතුවරයා ප්‍රියලාල් සිරිසේනය. එය බෙහෙවින් සරල එහෙත් කුතූහලය සහිත සුන්දර කතාවකි. බැලූ බැල්මට කෘතියේ සිරස් ඔස්සේ අපගේ සිත කියන්නේ එහි නව ළමා කතාවකට සුදුසු බවය. එහෙත් එය එසේ නොවේ. කතාවට පාදක වී ඇත්තේ ඉංග්‍රීසි පාලන සමයේ ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වයට සම්බන්ධ සිදුවීම් මාලාවකි. රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා පාර්ශ්ව කිහිපයක් අතර සිදුවන ගැටුම එක පැත්තක පවතින අතර අහඹු සිදුවීමක් ලෙස කතාවට එකතු වන 'දෙයියන්ගේ ඇතා' නව කතාවේ ප්‍රධාන ප්‍රස්තුතය හා ප්‍රධාන ගැටුම නිර්මාණය කරයි. කතුවරයා එම අහඹු සිදුවීම් පෙළ මනාව ගළපා ගනිමින් වින්දනීය කතාවක් ගොතයි. ඔහු සිය පෙරවදනෙහිලා සඳහන් කරන්නේ තමන්ගේ මුඛ්‍ය ආධ්‍යාසය, හාස්‍ය උත්පාදනය කෙරෙහි යොමුව තිබූ බව ය.

"මෙහි එන හස්තියා පිළිබඳ සඳහන් මනඃකල්පිතයක් පමණි. මේ කෘතිය හුදෙක්ම ඔබගේ හාස්‍ය රසය උදෙසා ලියැවුණු කෘතියක් වන අතර, එහි හාස්‍ය රසය මදි නම් කතුවරයා උදක්ම ඒ සම්බන්ධයෙන් පාඨකයාගේ සමාව අයැද සිටියි."

(කර්තෘ සටහන)

නිට්ටාවටම ගත් කළ මෙය ආකර්ෂණීය හා විචිත්‍ර ප්‍රබන්ධයක් මිස විහිළු කතාවක් නොවේ. සංකීර්ණ චරිත නිරූපණයක්, විචිත්‍ර පසුබිම් නිරූපනයක් හා දේශපාලනය පිළිබඳ යටි පෙළක් ද මේ කෘතියට ඇතුළත්ය. එබැවින් "දෙයියන්ගේ ඇතා" ප්‍රබන්ධය හුදු විහිළු කතාවකට ලඝු කළ යුතු නැත.

කතාවට පසුබිම් වන කාලය වනාහි ඉංග්‍රීසිකාරයා මෙරට මුහුදුබඩ පළාත්වල බලය අල්ලාගෙන සිටි සමය වෙයි. රටේ රාජ්‍ය බලය සමූහයක් අයිති කරගෙන සිටි අතර ඊට එරෙහිව සිංහල ප්‍රභූන් ගෙන ගිය සටන හා කුමන්ත්‍රණ වෙනම දකින්නට ලැබිණි. 18 සියවසේ මුල් කාර්තුව වන විට දේශපාලන කුමන්ත්‍රණ බහුල සංකීර්ණ දේශපාලන රටාවක් පැවතිණි. ඉංග්‍රීසිකාරයා රටේ සම්පත් කොල්ලකෑම සඳහා උපරිම උත්සාහයක් ගත් අතර නිදහස හා ස්වෛරීත්වය වෙනුවෙන් සිංහල ප්‍රභූ පන්තිය උනන්දු විය. ජනතාව පැතිකඩ කිහිපයකින්ම පීඩාවට ලක්වූහ.

නවකතාව ආරම්භ වන්නේ එංගලන්තයේ සිටි ප්‍රකට දඩයක්කාරයකු කොළඹට සම්ප්‍රාප්ත වන දර්ශන පෙළකින්ය.

ප්‍රියලාල් සිරිසේන

ඔහු කොළඹට පැමිණ බළකොටුවේ නවාතැන් ගත්තේ සුවිශේෂී අවස්ථාවකය. කතුවරයා එහි එන දර්ශන පෙළ ජීවමාන ලෙස නිරූපණය කරන ආකාරය අතිශයින්ම වැදගත්ය.

ඒ 1814 වර්ෂයේ මුල් භාගයේ දිනයකි. රාත්‍රී අන්ධකාරය මධ්‍යයේ ඉන්දියානු සාගරයේ රළ පෙළ වරින්වර ප්‍රාකාරයකින් වටවූ බළකොටුවට පහරදෙමින් සිටියේ කොටු පවුර බිඳින්නට තැත් කරන බළසේනාවක් මෙනි. අඳුරින් තැනූ දැවැන්ත පුවරුවලින් වට වූ කොළඹ කොටුව අඳුරින් වැසී ගොස් තිබූ නමුත් එහි නැඟෙනහිර කොටසේ ඉදිකර වූ ගොඩනැඟිලි තුළ අතරින් පතර එළිදැල්වී තිබිණි.

(පිටුව 201)

කතුවරයා නිරූපණය නම් ශිල්ප ධර්මය කෙරෙහි දැඩි අවධානය යොමු කර ඇති බව පෙනෙයි. නිරූපණය යැයි කියූ කළ එය චරිත නිරූපණයට පමණක් නොව සිද්ධි නිරූපණයට හා පසුබිම් නිරූපණයටත් යොමු විය යුතුය. එය සාර්ථක ප්‍රබන්ධයක කැපී පෙනෙන ලක්ෂණයකි. කතුවරයාගේ ජීවමාන සංවාද පාඨකයන්ගේ නිබද ආකර්ෂණයට යොමු වනු ඇත.

"අලි....!? "
"ඔව්"
"දළ තියෙන ඇත්තු!? "
"මොකද නැත්තේ....! "

කතුවරයා සිය සංවාද මෙහෙයවන්නේ නාට්‍යාකාරයෙන්ය. තමුසෙ දන්නවද ඌ ගැවසෙන ඉසව්ව?

"තව පොඩ්ඩකින් අපට හම්බ වෙනවා පරණගම කියලා ගම්මානයක්... අන්න...එහෙ"

දෙයියන්ගේ ඇතා මේ කතාවේ ප්‍රධාන චරිතයක් බවට පත්ව ඇත්තේ පාඨක ආකර්ෂණය උපරිම අයුරින් දිනා ගනිමින්ය. කතුවරයා හැමවිටම පාහේ විචිත්‍ර අත්දැකීමක් හා සරල සුන්දර කතාවක් රඟදැක්වීමට වෑයම් කරයි. එය සාධනීය ලක්ෂණයකි.

ලෝක වෙළෙඳාම පාදක කොටගෙන ආසියානු, අප්‍රිකානු හා ආසියානු රටවල් ආක්‍රමණයට යුරෝපීය ජාතීන් යොමු වන්නේ 13 වන සියවසේ අගභාගයේ පටන්ය. යුරෝපයේ ස්පාඤ්ඤය, ප්‍රංශය, පෘතුගාලය, නෙදර්ලන්තය වැනි රටවල් පළමුව මෙහි පෙරමුණු ගත් අතර පසුව එංගලන්තය ද ඊට එකතු විය. සාර්ථක නාවික තාක්ෂණයක් මෙන්ම බලසම්පන්න හමුදාවක් ද නඩත්තු කළ එංගලන්තය 18 වන සියවස වන විට තරගයේ පෙරමුණට පැමිණ ලෝක වෙළෙඳාමේ මෙන්ම අධිපතිවාදයේද පළමුවන්නා බවට පත්ව සිටියේය. එංගලන්තය ඒ අතින් විශාල වාසි ලබා ගත්තේය. පළමුව කෝපි වගාව සඳහා උචිත ඉඩම් සොයමින් ශ්‍රී ලංකාවට කඩා වැදුණු එංගලන්තය පසුව තේ වගාවට ප්‍රමුඛත්වය ලබා දුන්නේය. සාම්ප්‍රදායික ඉඩම්, කෘෂිකර්මය හා චාරිත්‍ර වාරිත්‍රවලට හුරුවී ස්වයංපෝෂිත ආර්ථික රටාවකට හුරුවී සිටි ශ්‍රී ලාංකිකයාට ඉංග්‍රීසිකාරයාගේ නවීකරණය ගැළපුණේ නැත. මේ අනුව දීර්ඝකාලීන ගැටුමක් වර්ධනය විය.

ඉහත පසුබිම ප්‍රබන්ධ කතාව සඳහා කදිම උත්තේජකයක් සපයා දෙයි. අප්‍රිකාවේ සාහිත්‍ය නව මානයකට යොමු කළ නයිජීරියානු ලේඛක චිනුවා අචෙබෙ සිය මුල්ම නවකතාව වූ "තින්ග්ස් පෝල් එගාර්ටි" නම් කෘතියට පාදක කර ගන්නේද අධිරාජ්‍යවාදය හා ස්වදේශිකත්වය අතර මතු වූ අරගලයයි. අප්‍රිකානු ලේඛකයෝ පසුකලෙක එම නවකතාවෙන් බොහෝ ආදර්ශ ලබා ගත්හ.

ඉඩම් ගැටලු, රාජ්‍ය පාලන ගැටලු, වෙළෙඳ ආර්ථිකය, ස්වදේශිකත්වය හා අධිරාජ්‍යවාදී චින්තනයේ ගැටුම, අධ්‍යාපනික ප්‍රශ්න, ප්‍රේම කතාන්දර ආදිය තේමාකොටගෙන සිංහල නවකතා ගණනාවක් නිර්මාණය වී ඇත්තේ ඉහත කී පසුබිම ප්‍රබන්ධයට කදිම තෝතැන්නක් කරගනිමින්ය. අදත් එබඳු කතා බිහිවනු දැකිය හැකිය. මේ කතාවලින් බහුතරය එක්කො ඓතිහාසික කතා වස්තුවක් ගෙනහැර දක්වයි. නැතහොත් අනුවේදනීය කතාවක් ගෙනහැර දක්වයි.

ප්‍රියලාල් සිරිසේන ලේඛකයා අවශේෂ මාතෘකාවක් තෝරාගෙන ඉහත කී පසුබිම තුළම අපූරු ප්‍රබන්ධයක් ගොතයි. ඔහු සිය කාර්ය මැනවින් ඉටුකර තිබේ. "දෙයියන්ගේ ඇතා" රසවත් මෙන්ම අර්ථවත් නව ප්‍රබන්ධයකි.

රන්ජන් අමරරත්න

2025 ජනවාරි 02 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.